සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 9 - 2019

නම/විභාග අංකය :.......................................  කතෝලික ධර්මය  කාලය: පැය 02යි.

## I කොටස

I ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමේ 1, 2 මකබි පොත් අයත් වන පොත් කාණ්ඩය වන්නේ
1. ප්‍රඥා සාහිත්‍යය ය.
2. ඉතිහාස ය.
3. දිවැසිවර ය.
4. නීති ය.

(2) වර්තමානයේ විශ්වාසය නිසා පීඩාවලට ලක් වී ඇති කිතුණුවන් වෙනුවෙන් අප විසින් කළයුතු කාර්යය
1. අපගේ ජීවිතය පූජා කිරීම ය.
2. තවත් විශ්වාසකයින් සභාවට එක් කිරීම ය.
3. විශ්වාසය වෙනුවෙන් දිවි පිදූ අයට ස්තුති කිරීම ය.
4. දේව වචනය තුළ ශක්තිමත් වීම ය.

(3) පහත සඳහන් වන්නේ ගීතාවලිය පිළිබඳ ශිෂ්‍යයෙක් ඉදිරිපත් කළ තොරතුරු කිහිපයකි. ඒවායින් නිවැරදි තොරතුරු පමණක් සඳහන් පිළිතුර වන්නේ
(A) ගීතාවලිය යනු යාච්ඤාමය ගීතිකා 100ක එකතුවකින් යුතු පොතකි.
(B) ගීතාවලිය ශුද්ධ බයිබලයේ යාච්ඤා පොත ලෙස ද හැඳින්වේ.
(C) මෙහි එන සෑම ගීතිකාවක් ම තත් සහිත වාද්‍ය භාණ්ඩක් සමඟ ගායනා කළ ඒවා ය.
(D) සාම්ප්‍රදායිකව දාවිත් රජතුමා ගීතාවලියෙහි කතෘ ලෙස පිළිගනී.
1. ABC
2. BCD
3. ACD
4. ABD

(4) සමදර්ශක කතුවරුන් තිදෙනා සමාන ආකාරයෙන් දකින ජේසුස් වහන්සේගේ ජීවිත සිදුවීම වන්නේ,
1. උපත ය.
2. කැපකිරීම ය.
3. බෞතිස්මය ය.
4. මරණය ය.

(5) ''සැබෑ මිදි වැල මම වෙමි'' (ජොහාන් 15, 1 ) මෙහි මිදි වැල ලෙස අර්ථ කථනය කරනුයේ
1. දෙවියන් වහන්සේ ය.
2. ක්‍රිස්තුන් වහන්සේ ය.
3. ශුධාත්මයාණන් වහන්සේ ය.
4. අපෝස්තුලුවරු ය.

(6) දෙවියන් වහන්සේ ආදි මව්පියන්ට දඬුවම් කළේ,
1. වෛරයෙනි.
2. ප්‍රේමයෙනි.
3. අනුකම්පාවෙනි.
4. වේදනාවෙනි.

(7) දේව දරුවන් ලෙස අප අන් අයට ඊර්ෂ්‍යා නොකල යුතු බව අවධාරණය කරන සිද්ධියකි,
1. ආදම් සහ ඒව පාපයට වැටීම.
2. දෙවියන් වහන්සේ ආදි මව්පියන්ට දඬුවම් කිරීම.
3. කායින් විසින් ආබෙල් මරා දැමීම.
4. නෝවා සහ ජල ගැලීම.

(8) දෙවියන් වහන්සේ කායින් පිට තැබූ 'සළකුණ',
1. ප්‍රේමයේ හා ගෞරවයේ ලාංඡනයකි.
2. ජීවිතයේ නොමැකෙන ලාංඡනයකි.
3. දණ්ඩනයේ නොව දේව රැකවරණයේ ලාංඡනයකි.
4. දඬුවමින් නිදහස ලැබීමේ ලාංඡනයකි.

(9) මනුෂ්‍යයාගේ පාපය මුළු මහත් මැවිල්ලටම විනාශකාරී ලෙස බලපාන බව පෙන්නුම් කරන්නේ,
1. නෝවා සහ ජල ගැල්ම තුළිනි. 2. බාබෙල් කොත සම්බන්ධ සිද්ධියෙනි.
3. කායින් ආබෙල් සම්බන්ධ සිද්ධියෙනි. 4. ආදම්ගේ පාපය තුළිනි.

(10) ගිඩියොන් නම් වීර නායකයා ව දෙවියන් වහන්සේ විසින් කැඳවන්නේ ඊශ්‍රායලයේ ජනතාව,
1. අම්මොන්වරුන්ගෙන් ගලවා ගැනීමට ය. 2. පිලිස්තිවරුන්ගෙන් ගලවා ගැනීමට ය.
3. කානානිවරුන්ගෙන් ගලවා ගැනීමට ය. 4. මිදියන්වරුන්ගෙන් ගලවා ගැනීමට ය.

(11) ''මිනිසා බලන්නේ බාහිර පෙනීම දෙස ය. එහෙත් සමිඳාණන් වහන්සේ බලන්නේ සිත දෙස ය.'' මෙම පාඨය අදාල වන්නේ පහත සඳහන් කවර කරුණු සම්බන්ධයෙන් ද?
1. සාවුල් රජ වශයෙන් තෝරා ගැනීමේදී 2. ගිඩියොන් වීරවරුන් අතරට පත් කිරීමේදී
3. දාවිත් රජ වශයෙන් තෝරා ගැනීමේ දී 4. සාමුවෙල් දිවැසිවරයෙකු ලෙස පත් කිරීමේදී

(12) අලසකම නමැති මුල් අගුණ පාපය නැති කර ගන්නට දියුණු කර ගත යුතු ගුණ ධර්මය නම්,
1. ත්‍යාගීවන්තකම ය. 2. බැහැපත් කමය.
3. මිථ්‍යාචාරය ය. 4. උද්යෝගය ය.

(13) පාපයෙහි දිවි - ගෙවන්නාට පසුතැවීමට ජේසුස් වහන්සේ අවස්ථාව ලබාදෙන්නේ,
1. මිනිසා දේව මැවිල්ලක් වන නිසා ය.
2. සැම කෙනෙකුම ස්වර්ගයට ඇතුළු විය යුතු නිසා ය.
3. සිය පොරොන්දු ඉටු කිරීමට කාලය ගතවන නිසා ය.
4. මිනිසාට දේව සමාන කම ඇති නිසා ය.

(14) රෝගීන්ගේ ආලේපය ''අන්තිම ආලේපය'' ලෙස හඳුන්වන්නේ,
1. බරපතල රෝගියෙකුට මෙම ප්‍රසාද නිධානය දානය කරන නිසා ය.
2. කෙනෙකු තම ජීවිතයේ අවසාන කොට ලබා ගන්නා ආලේපය නිසා ය.
3. මරණාසන්න අයට මෙම ආලේපය ලබාදෙන නිසා ය.
4. මෙමඟින් අධ්‍යාත්මික සුවයක් ලැබෙන නිසා ය.

(15) පිළිසිඳගත් මොහොතේ පටන් ජීවිතය දෙවියන් වහන්සේට අයිති බව පෙන්වා දෙන දිවැසිවරයා,
1. මලාකි ය. 2. යෙසායා ය. 3. ජෙරමියයා ය. 4. ජෝවෙල් ය.

(16) දෙවියන් වහන්සේට අයිති වස්තුවක් අප සතුකර ගැනීමට ගන්නා උත්සාහයකි.
1. සිය දිවි නසා ගැනීම. 2. සොරකම් කිරීම.
3. වෙනත් දෙවිවරුන්ට වන්දනා කිරීම. 4. අන් වස්තු ආශා කිරීම.

(17) දේව දරුවන් ලෙස අපගේ විශේෂ ලක්ෂණයක් විය යුත්තේ,
1. සමාව දීම ය. 2. පළි නොගැනීම ය.
3. අසල්වැසි ප්‍රේමය ය. 4. බෙදා හදා ගැනීම ය.

(18) 1 කොරින්ති 6, 13 පාඨයට අනුව ශරීරය කුමක් සඳහා ද?
1. සමිඳාණන් වහන්සේ උදෙසා ය. 2. අනාචාරය උදෙසා ය.
3. සැප විහරණය සඳහා ය. 4. සමාජ සේවය සඳහා ය.

(19) ''මාගේ ගැලවුම්කාර ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට පමණක් මා අයිති ය.'' කියමින් ජීවිතය පූජා කළ සාන්තුවරිය වන්නේ,
1. ශුද්ධ වූ ඇග්නස් තුමිය යි. 2. ශුද්ධ වූ මරිය ගොරිත්ති තුමිය යි.
3. ශුද්ධ වූ මර්ගරිතා මරිය තුමිය යි. 4. ශුද්ධ වූ පවුස්තිනා තුමිය යි.

(20) ක්‍රියාශීලී කුඩා කිතුනු සංසවල පදනම වන්නේ,
1. කුඩා දරුවන් ය. 2. වැඩිහිටියන් ය.
3. ජපමාලය ය. 4. දේව වචනය ය.

(ල. 20 x 2 = 40)

## II කොටස

I පළමු වන ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

---

(1) කෙටි පිළිතුරු සපයන්න.
- (i) දිවැසිවර ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
- (ii) වීර නායකයින් දෙදෙනෙක් නම් කරන්න.
- (iii) මුල් අගුණ පාපයන් දෙකක් නම් කරන්න.
- (iv) පාපයට ලැබෙන දඬුවම් දෙවර්ගය ලියන්න.
- (v) රෝගීන් ආලේපය ලැබීමට සුදුසුකම් ලබන කණ්ඩායම් දෙකක් නම් කරන්න.
- (vi) ජීවිතය විනාශ වීමට හේතු වන කරුණු දෙකක් ලියන්න.
- (vii) පාරිශුද්ධ ජීවිතයක් ගත කිරීමට කළ හැකි දේවල් දෙකක් ලියන්න.
- (viii) කාර්මෙල් කන්ද මත යාග පූජා සූදානම් කළ පාර්ශව දෙක නම් කරන්න.
- (ix) ඥානවන්ත සිතක් ඉල්ලූ සලමොන් රජතුමාට දෙවියන් වහන්සේ දානය කළ වෙනත් දේවල් දෙකක් ලියන්න.
- (x) යාච්ඤාවේ ප්‍රභේද දෙකක් නම් කරන්න.

(ල. $2 \times 10 = 20$)

(2)
- (i) ප්‍රඥා සාහිත්‍ය පොත් දෙකක් නම් කරන්න.. (ල. 2)
- (ii) නව ගිවිසුමේ පොත් බෙදෙන ප්‍රධාන කොටස් තුන නම් කරන්න. (ල. 3)
- (iii) ශුභාරංචි ග්‍රන්ථ හතර පරිශීලනය කිරීමෙන් කිතුනු සිසු දරු ඔබ එමඟින් තම ජීවිතයට ලබා ගන්නා ආදර්ශයන් පහක් ලියන්න. (ල. 5)

(3)
- (i) කායින් සහ ආබෙල්ගේ පඬුරු සම්බන්ධයෙන් දෙවියන් වහන්සේ ක්‍රියා කළ ආකාර දෙක ලියන්න. (ල. 2)
- (ii) වර්තමාන සමාජයේ දක්නට ලැබෙන පාපී ක්‍රියා තුනක් ලියන්න. (ල. 3)
- (iii) නෝවාගේ ජීවිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශයන් පහක් ලියන්න. (ල. 5)

(4)
- (i) ගිඩියොන් මිදියන් කඳවුර අත්කර ගැනීමට කළ කාර්යයන් දෙක ලියන්න. (ල. 2)
- (ii) සාමුවෙල් නම් විනිශ්චයකරුවා වසරින් වසර ගමන් කළ ස්ථාන තුන නම් කරන්න. (ල. 3)
- (iii) ඔබට ලැබෙන දේව කැඳවීමට විශ්වාසයෙන් පිළිතුරු දීමට ළමා වියේ සිටම ඔබ කටයුතු කරන ආකාර පහක් ලියන්න. (ල. 5)

(5)
- (i) දේව වරප්‍රසාද කොටස් දෙක නම් කරන්න. (ල. 2)
- (ii) සුළු පාපයෙන් ලැබෙන විපාක තුනක් ලියන්න. (ල. 3)
- (iii) දැහැමි ජීවිතයක් ගත කිරීමට කිතුනු සිසු දරු ඔබ ගන්නා ක්‍රියා මාර්ග පහක් ලියන්න. (ල. 5)

(6)
- (i) ජේසුස් වහන්සේ කන්ද උඩ දේශනයේදී පස්වන පනත සිහි ගන්වමින් කරන ඉගැන්වීම් දෙකක් ලියන්න. (ල. 2)
- (ii) හයවන පනතට විරුද්ධ පාපයන් තුනක් නම් කරන්න. (ල. 3)
- (iii) වත්මන් සමාජයේ නව විද්‍යාත්මක දැනුම නිසා නොමඟ ගොස් සිටින චරිත පාරිශුද්ධිය රැක ගැනීමට අපොහොසත් මිතුරෙකුට හෝ මිතුරියකට යහපත් මඟ පෙන්වීමක් සඳහා ඔබ කරන යෝජනා පහක් ලියන්න. (ල. 5)

(7)
- (i) ප්‍රසාද ස්නාපනය මඟින් කතෝලික වන සැමට හිමිවන ජීවිත තත්ව දෙක ලියන්න. (ල. 2)
- (ii) නව ගිවිසුමේ සඳහන් උදාන ගී තුනක් නම් කරන්න. (ල. 3)
- (iii) රටේ පවතින වත්මන් තත්වය හමුවේ නව යොවුන් වියේ පසුවන ඔබ කිතුනු සිසු දරුවෙකු ලෙස රටේ සාමය හා සංහිඳියාව ගොඩනැගීම සඳහා කිවහැකි යැදුමක් නිර්මාණය කරන්න. (ල. 5)